## කාන්තා දේශපාලනයේ අභියෝගය

සර්වජන ඡන්ද බලය හා සමගාමීව ගෙවීගොස් ඇති දශක අටකට ආසන්න ඉතිහාසයේ මෙරටේ සිදු වූ තීරණාත්මක දේශපාලන පරිවර්ථනය වූයේ 1948 දි ලත් ඩොමීනියන් නිදහසයි. ඉන් අනතුරුව ඇති වූ ජාතිවාදී අරගල කිහිපයක් හා කරුණු නැගිවීම් දෙක ද ඇතුළත්ව සිදු වූ දේශපාලන තිගැස්සීම් සංඛ්‍යාව අසීමිතය එකී දේශපාලන සංසිද්ධීන් අතර දැඩි විවාදාත්මක පරිසරයක් තුළ මෙරටේ සිදු වූ සුවිශේෂී පෙරළියක් වන්නේ 25% ලෙසින් කාන්තා දේශපාලන ක්‍රියාකාරිනියන් උදෙසා පිරිනමන ලද කෝටාවයි. එය මෙරටේ කාන්තා ක්‍රියාකාරිනියන් දියත් කරන ලද දීර්ඝ කාලීන අරගලයක එක් මංසලකුණකි. එහෙත් මෙම ලිපියේ දී සලකා බලනුයේ එලෙස ප්‍රදානය කරන ලද දේශපාන නියෝජනයේ කාන්තා පංගුව පිළිබද විවරණයක් නොවේ . එලෙස ප්‍රවර්ධනය කිරීමට තැත් දරන කාන්තා දේශපාලන නියෝජනයට ප්‍රතිරෝධයක් ලෙස ක්‍රියා කරන යමක්ය එනම් මැතිවරණ ව්‍යාපාර මූල්‍ය කරණය හා කාන්තා දේශපාලනය අතර පවත්නා අවියෝජනීය සම්බන්ධය පිළිබදව දැඩි අර්බුදකාරී වාතාවරණයක ඉමහත් වාදවිවාද මාධ්‍යයේ හඳුන්වාදුන් කාන්තා දේශපාලන නියෝජනයේ පංගුව අද වන විට වැටී ඇත්තේ දැඩි අනතුරුදායක මට්ටමකටය. ඒ විවිධාකාර හේතු රාශියක් නිසාය.

01. කාන්තා කෝටාව උපයෝගී කර ගනිමින් පළාත් පාලන ආයතන සදහා තෝරාපත් කරගෙන ඇති කාන්තා නියෝජිතයන්ගේ කාර්යක්ෂමතා හා ක්‍රියාකාරී සහභාගීත්වය ගැටලුකාරීය . අපේක්ෂිත ප්‍රතිඵල අත්කරගෙන ඇත්තේ ඉතා ස්වල්ප දෙනෙක් බව බැලූ බැල්මට පෙනී යයි
02. යම් සාධනීය මැදිහත්වීමක් සිදු කරමින් සිටින කාන්තා ක්‍රියාකාරිනියන් සදහා අදාළ දේශපාලන පක්ෂ වලින් කිසිදු සහයක් නොලැබීම.
03. සමාජ පසුතලයක් තුළ කාන්තා දේශපාලන නියෝජනය සාදරයෙන් පිළිගැනීමට සමත් ආකාරයක් දිස් නොවීම.

*මංජුල ගජනායක, ජාතික සම්බන්ධීකාරක, මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය*